84916.

විසිතුරු අම්බලමක්

වාල්ස් ගොඩකුඹුරේ

''අම්බලම'' යන්නෙහි අර්ථය

අම්බලම නම් නැවතුම්පළකි. මෙය පළමුවෙන් මහජනයාගේ ප්‍රයෝජනය පිණිස වෙන් කරනලද ආවරණ රහිත භූමියක් විය. ඒ විශාල ගසක් යට සෙවනැල්ලේ විය. ගම්සභාව එක්වන තැන හෝ පණ්ඩිත සභාව පවත්වන තැනද එයම විය. නොයෙක් සෙල්ලම් ක්‍රීඩාද අම්බලම්වල පවත්වනලදි. එසේම අම්බලම ගමේ ආදායම් එක්කරන කන්තෝරුවද විය.

අම්බලමක ප්‍රයෝජන

ගහේ සෙවනැල්ලම අව්ව වැස්ස නැවැත්වීමට ප්‍රමාණ නොවූ හෙයින් ගස යට පොඩි ගෙයක් තනන ලදි. එසේම ගසක ආධාර නොමැතිවද ගෙවල් සාදන්ටවිය. පසු ව්‍යවහාරයෙහි එම ගෙය අම්බලම නමින් හැඳින්විනි. මෙම අම්බලන් විශේෂයෙන් සාදන ලද්දේ ප්‍රසිද්ධ මංමාවත් අසළ විය. මංමාවත් කුඹුරුයායවල් ඔස්සේ වැටුණු හෙයින් බොහෝසෙයින් විශාල කුඹුරුයාය අසළ පාරවල් අයිනේ අම්බලන් දකින්ට ලැබේ. මෙම අම්බලන් විශේෂයෙන් කරනලද්දේ දුර බැහැර රාජකාරි සඳහා හෝ නැගමන් හෝ වන්දනා ගමන් හෝ යන මගීන්ගේ ප්‍රයෝජනය පිණිසය. මාර්ගිකයන් උදෙසා පමණක් නොව පළමුවෙන් කී පරිදි ගම්මුන්ගේම ප්‍රයෝජනය පිණිසද අම්බලන් ඉදිකරනලදි. අම්බලන් ගමට පිටින් එන්නන්ගේ නැවතුම්පළද විය. රටේ තොටේ ආරංචි හුවමාරු වන තැන අම්බලම විය. අම්බලමට එක්වන ජනයා බුලත් සපමින් සුවසේ ලහියක් නැතුව ඉඳගෙන රජුන් ඇමැති වරුන් පිළිබඳ තොරතුරු ගැන හා රාජකාරි ගොවිතැන් ආදිය ගැන කථාවන්හි යෙදුනෝය. එම ඈත කාලවලදී රටවැසි ජනයා දේශපාලන තොරතුරු ඇසුවේ කීවේද අම්බලන්වලට එක්වූ විටය. ක්‍රිස්තු වර්ෂයෙන් 1410 යේ පටන් 1467 න දක්වා ජයවර්ධන කෝට්ටේ රජකළ ශ්‍රී පරාක්‍රම බාහුමහරජුගේ කල්හි වර්තමාන බස්නාහිර පළාතේ, බෙන්තොටට දකුණෙන් වැලිතොට නම් ගමේ පිහිටියාවූ අම්බලමක් කෝට්ටේ සිට තොටගමුවට යන මාර්ගයේ වර්ණනාවක් ඇතුළත්වූ ගිරාසන්දේශයේ විස්තරකරනු ලැබේ. මෙම වර්ණනාවෙන්ද එම අම්බලම ගසක් යට සාද තිබූ බව කියවෙයි. පාඨකයා අම්බලම යනු කුමන විදියේ ගොඩනැගිල්ලක්දැයි දන්නා හෙයින් අම්බලමේ නිර්මාණය පිළිබඳව කිසිවක් නොකියවේ. එහෙත් අම්බලමේ රැස්ව සැනපුණු ජනයා කාලය ගතකළ





සැලසුම් 1–2

අන්දම කියන දීර්ඝවර්ණනාවකි. අම්බලමේ විස්තර ඇරඹෙන්නේ මෙසේය.

නිල් පැ හැ බ ර කොළ අතු පතර විසි තුරේ
දි ගු ත ර ස ර මහකිඳු විහිදි මන හරේ
රැ දි පි ය ක ර බිහු අද සෙනග නොවි තරේ
තුරු කි ඳු තු ර සැනපෙව අම්බලම නුරේ

(ගිරාසන්දේශය, පඤ්ඤාසාර – විමලධම්ම සංස්කරණය, 1933 – 104 වෙනි සිවුපදය.)

අම්බලමේ රැස්වූ ජනයා අතරේ ඇතිවූ කථා මෙතැන් පටන් කෙටි කවි 54 කින් විස්තර කරන ලදි. ඒ විස්තර කථාවට එවක සිරිලක එක්සත් කොට පසකල ශ්‍රී පරාක්‍රමබාහු මහරජාණන්ගෙ ගුණකථනයක්ද රැස්ව සිටි මහජනයා කියනසේ එක්කොට තිබේ. මේ කීර්තිකථනයෙන් එම කාලයේ රටේ තොරතුරුද දැනගත හැකිය.

කෝට්ටෙට ලඟ ප්‍රදේශයෙහි පොකුණක් අසල විශ්‍රාම ශාලාවක් ගිරාසන්දේශයට සමකාලීනවූ සැලළිහිණිසන්දේශයෙන් වර්ණනාකරනු ලැබේ.

ම ල් ද ම් සුවඳ දුම් දත් සොද වරලසිනි
ක ල් ගි ම් නිවා සැනහෙන සිහිල සරසිනි
කොල්ලම් ගසින් නිල් ඉවුරැති පොකුණ සිනි
ව ල් අ ම් බලම දුක යාගත් සහනොසිනි

(ධර්මාරාම සංස්කරණය, 33 වෙනි සිවුපදය)

පුරාණ සන්නයේ අර්ථ කියා ඇති පරිදි වල් අම්බලම යනු ගමක් නොව අම්බලමක්ම විය.

(සන්නය; වල් අම්බලම, එනම් විශ්‍රාම ශාලාව)

අම්බලමක් සාදන හැටි

දගැබ් බුදුගෙවල් ආදිය පින් තකා කරන්නාක් මෙන් ගම්වැසියෝ එක්ව අම්බලන්ද පින් පිණිස කරති. පින් අරභයා කරන දේ හොඳින් කිරීම සිරිතක්ය. එහෙයින් යම් ගමක අම්බලමක විශාලකම හෝ වටිනාකම එය කරන සැදැහැවතුන්ගෙ පුළුවන්කාරකම අනුව වේ. ඇතැම් විට ඒ ඒ ප්‍රභූජනයා විසින්ද තනි වියදමින් අම්බලන් කරනු ලැබේ.

ඉතාම පොඩි අම්බලම සාදන්නේ වාඩිවීමට ලීකොට හතරක් ගල්ගෙඩි මත තබා අයිනේ කණු සතරක් පිට වහලක් ඉදිකරය. වාඩිවීමට අත්තිවාරම පිණිස ගන්නා ලී ගල්මත තබන්නේ වේයන්ගෙන් ආරක්ෂාවීම පිණිසය. ගෙය හරි හතරැස් කොට සාදනවා නම් වහලට මුදුන් යටලියක් නැත. වහල සතර කැණිමඬලකින් එක් කොට මැටිකොතක් තබණු ලැබේ. ගෙයි එක් පැත්තක් දිගින් වැඩි නම් කෙටි මුදුන් යටලියකින් වහල නිමවේ. මුදුන් යටලියේ දෙකෙලවර කොත් දෙකක් පිහිටවනු ලැබේ. අම්බලම කරන්නන්ගේ පුළුවන්කම අනුව වහල පිදුරෙන් හෝ පොල්අතු වලින් හෝ උළුයෙන් සෙවිලිකරනු ලැබේ.

ගලින් හෝ ගඩොලින් කුළුණු බැඳ ඊ පිට මහල ගසාද අම්බලන් සාදනු ලැබේ. මෙසේ සාදන ලද අම්බලන් වටේට කොට බිත්තිද බඳිති. ඒ බිත්ති වාඩිවීමට බංකු වශයෙන් පාවිච්චි වන නිසා බිත්තිය මත පලල් ගණකම් ඇති ලෑලි සවි කරනු ලැබේ.



1 අම්බලමේ ලී කණු



2 කුරුපාවේ ගන්දිය

සමහර අම්බලන් සෑදීමේදී ගල්කණු ගනිති. නැතහොත් ඉරු ලීකණු ගනිති. කණු මත කතුරු හා ජේකඩය. අම්බලම විශාලට කරනවිට කණු සතරකට වඩා යොදති. බාල්ක තලන් යටලී කුරුපා ආදිය අම්බලමේ තරමට ගනිති. හොඳින් අම්බලමක් කරන විට කණු ජේකඩ බාල්ක යටලී තලන් ආදි දැවද මනාසේ රූපකර්ම කැටයම් වලින් අලංකාර කරනුලැබේ. බදම ගෑ කණු බිත්ති ඇත්නම් ඒවායේ සිතුයම්ද අඳිති.

රැයක් එහි ගතකරන්නන්ගේ ප්‍රයෝජනය පිණිස ඇතැම් අම්බලන්වල කාමරයක්ද බඳවති. කාමර ගෙයක් නැති තැන පිලීවැලක් ඇද කාමරයක් කරති. අම්බලන්වලට එන අය තමන්ගේ කෑම බැඳගෙන ගෙනෙන නිසා අම්බලමට කුස්සියක් නැත. එහෙත් අම්බලමක් ළඟ බීම පිණිස දිය සැපයීමට පින්නාලියක් වේ.

අම්බලමක විස්තරයක්

දකුණු පළාතේ ගිරුවාපත්තුවේ පලොන්නරුව නම් ගමේ වෙළක් අහබඩ තුබූ අම්බලමක් දහඅට වන ශතවර්ෂය අගදී බරණ ගණිතාචාර්යයන් විසින් කරන ලද නිලකොබෝසන්දේගයේ විස්තර කර ඇත. එයින් මේ අම්බලමෙහි සිංහ ව්‍යාඝ්‍ර චිත්‍රකර්ම කර තිබූ බවද කියයි. එම අම්බලම ගසක් යට සාද තිබූ බවද කියවේ.

බෙ ලෙන් සුරුවූ විස්සමසුර වැද ආල
කෙ ලෙන් යුරු නෙසිහවග සිතුයමිනු දුල
ප ලෙ න් පිරු කඳුරු රුක වෙන වන ආල
ප ලො න් නරු වෙලස සැදි අම්බලම බල

ගිම හිරු වන් දන එමඩ මටා පන
පිවි තුරු කෙනඹ එකෙණෙහි නොම
කොටා සින
ගන සුරු පන සලන වට රුක් වටා පන
එ ඉ සුරු දුටු න සින නෙන සහතුටා වෙන

(නිලකොබෝසන්දේශය, 1915 සංස්කරණය, 22 – 23)

දෙගල්දෙරුවේ ලෙන් විහාරයේ චිත්‍රසිතුවම් අතර චුල්ලසුතසොමජාතක කථාවේ රජකුමරුන් දෙදෙනෙක් අම්බලමක එක්ව ඉන්නා සැටි පෙන්වන්. මේ අම්බලමද පිහිටා ඇත්තේ ගස් යටයි. (ඡායාරූපය, 12).

පනාවිටියේ අම්බලම

අප විසින් මෙහිලා විස්තර කරනු ලබන්නේ දැනට වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය සම්මත කොට්ඨාශයේ දඹදෙණි හත්පත්තුවේ මයුරාවති කෝරළේ පනාවිටිය නම් ගමේ පිහිටි අම්බලමකි. ඒ පිහිටා තිබෙන්නේ ඉතා විශාල වෙල්යායක්

3 මුදුන් පරාල



අහබඩය. මේ වෙල ඔස්සේ දඹදෙණියේ සිට යාපහුව හා කුරුණෑගල අතට ගිය පාරක් තිබුණේ යයි පැරණි ගම්වැස්සෝ කියති.

පනාවිටියේ අම්බලම ඉතාම කුඩා වර්ගයේ අම්බලම් විශෙෂයට අයිතිය. එය ගොඩනගා තිබෙන්නේ කැටගල් හා කැඩුගල්වලින් පුරවා අඩිබාගයක් පමණ පොළෝ මට්ටමින් උඩට ඉස්වූ ගෙපළක් පිට තැබූ අඩියක් පමණ උසැති ගල්පිට ඇදූ දූව උඩය. ගොඩනැගිල්ල දිගින් අඩි 14 ක් හා පළලින් අඩි 12 කුත් අහල් 8 ක් වේ. දූව අඩියේ පටන් අහල් 8 දක්වා ඝනවේ. එක පැත්තකට දූව දෙක බැගින්ය. දූව පිට කොන් හතරේ ලී කණු හතර බැගින්ය. දිග පැතිවල මැදින් කණු හතර බැගින් වේ. එක කොට පැත්තක දූව දෙක පිට තව කණු දෙකක්ය. ගොඩනැගිල්ලේ අත්තිවාරමේ පටන් මුදුන් යටලිය දක්වා උස අඩි 10 යි අහල් 6 යය. දිග අතට පලේ අඩි 18 ක් දිගය. මුදුන් යටලීයේ දිග අඩි තුනකුත් අහල් හතය. වහලයේ වඩුවැඩ බාල්ක තලන් යටලි හරස් යටලි කතුරුලී කුරුපා පරාල මුදුන්පරාල හා මුදුන්යටලීයෙන්ද යුක්තය.

ප්‍රමාණයෙන් කුඩාවූ නමුත් පනාවිටියේ අම්බලමේ වටිනාකම එය ගොඩනැගීමට යෙදූ දූව කණු හා අනික් ලීවල කර ඇති කැටයම්ය. මේ කැටයම් ක්‍රිස්තු වර්ෂයෙන් දහඅටවන සියවසට පමණ අයිති යයි සිතිය හැකිය. කැටයම් අතරේ මිනිස්රූප සත්ත්වරූප මල් කොළ ආදිය වේ. එසේම වැල් ගැට තරු ආදියද ඇත. සියළුම රූප කර

4 හරස් යටලියක්





5 කණුවක කැටයම් කළ රූප



6 මල් කැටයමක්

7 නෙළුම් මලක්



8 ලණු ගැටයක්



9 නයි දරණයක්

සැලසුම් :

අම්බලම - (1) පැත්තකින් පෙනෙන හැටි. (හරස් කැපුම)

(2) බිම බෙදුම සහ වහල යෙදෙනා හැටි. තිත්ඉරෙන් පෙන්වන්නේ බිම බෙදුමය.

පොල්අතු සෙවිලි කළ පනාවිටියේ දිරාපත්ව ගොස් තිබෙන අම්බලමේ ඡායාරූපයක් 1960 වර්ෂය සඳහා පුරාවිද්‍යා කොමසාරිස්තැනගේ වාර්තාවේ දහනවවෙනි ඡායාරූපය හැටියට ප්‍රසිද්ධකර ඇත.

එහිම විසිවෙනි "ඒ" අක්ෂරය දරන ඡායාරූපය හැටියට අම්බලමේ කණුවක කොටා ඇති මිනිසුන් දෙදෙනෙකු යොද කළ රටාවක් හා විසිවෙනි "බී" අක්ෂරය දරන ඡායාරූපය හැටියට කණුවක ඇති මල් හා කොළ රටාවක්ද පෙන්වා ඇත.

තවද ලංකාකලාමණ්ඩලය විසින් නිකුත් කරන මෙම ත්‍රෛමාසික කලාසඟරාවේ වර්ෂය 1961 කේ සැප්තැම්බර් මාසයට පළවුන 4 වෙනි කලාපයේ අප විසින් පළ කළ "සිංහල නාට්‍යය හා වාදනය" නම් ලිපියේ පනාවිටියේ කැටයම් අතුරෙන් හොරණෑ පිඹින්නන් දෙදෙනෙකු ගේ රූප හා බෙරගසන්නෙකු හා නටන්නෙකුගේ රූප ඇතුලත් කර ඇත.

මෙහි දැන් පළවන ලිපිය සම්බන්ධයෙන් මතු දක්වන ඡායාරූප එක්කරමු.

ඇත්තේ ලියවුවාගේ තියන පහසුවෙන් යොදන්ට පුළුවන්වනයේ මිනුම් ගණිත ක්‍රමයට හරිහැටි සමකොට බෙදගන්නට පුළුවන් ක්‍රමවලටය.

මෙම අම්බලමේ වහලය මුලදී උළුසෙවිලිකර තිබූ බව ඒ භූමියෙහි තිබී සම්බවූ පෙති උළුකැට වලින් ඔප්පුවේ. නුමුත් මෑතකාලයේදී එය පොල්-අතු වලින් වසා තිබුණේය. (1 වෙනි ඡායාරූපය.) ප්‍රවාසයට යන්ට එන්නැර තිබූ එම ගොඩනැගිල්ල පිට පොල් ගසක් කඩා වැටීමෙන් එහි තත්ත්වය තවත් දුර්වල විය. මෙසේ තිබුණු අම්බලම ශාස්ත්‍රීය ක්‍රමයට තහවුරු කිරීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් යෝජනා කරන ලදින් සංස්කෘතික දෙපාර්තමේන්තුවෙන් මුදලින් ආධාරද ලැබුණෙන් අම්බලමේ දැව ආදිය තහවුරු කොට ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩ ආරම්භකර දැන් අවසන් තැනට පැමිණ තිබේ.

පනාවිටියේ අම්බලමේ ලීවැඩ හා කැටයම් ස්වල්ප පමණින් ඡායාරූපවලින් මෙහි පෙන්වමු. පළමුකොට ගොඩනැගිල්ලේ නිර්මාණය පෙන්වන සැලසුම්ද බහාලමු.

10 නැටුම්වෙක්

ඡායාරූපය: 1

මෙම ඡායාරූපයෙන් අම්බලමෙ ඇතුලේ කණු පෙන්වනු ලැබේ. වැඩි ගණනක් කණු රූපකර්ම වලින් යුක්තය. ටිකක රූපකර්ම නැත. කණුවල කැටයම් අතර සත්වරූප මල්පෙති ලියකම් ලණු දඟර හා තවත් නොයෙක් බෙදුම්වලින් යුක්තවූ රූපකර්මවේ. කණුවල කැටයම් කළ පේකඩද මෙහි පෙනේ. රූපකර්මයෙන් අලංකාර කරන ලද හරස් යටලිවලින් එකක ඇත්රූප හා අනික් යටලියක සිංහරූපද වේ. (4 වෙනි ඡායාරූපය බලන්න). කණු පිට දූව නංවා තිබෙන අන්දම පින්තූරයෙන් පෙනේ.

ඡායාරූපය: 2

මෙහි මුදුන් යටලියේ දකුණු කෙළවරට කුරුපාව සන්ධි වන තැන පෙන්වයි. එතැන මුදුන් පරාල මූට්ටු වන හැටිද පෙනේ. කුරුපාවේ නයිදඟරයකි. (9 වෙනි ඡායාරූපය හා සමකර බලන්න.)

ඡායාරූපය: 3

මුදුන් පරාල එක්වන තැනක්. පරාලවල යටි පැත්ත හැඩකර ඇති හැටි බලන්න.

11 නලහනක්



12 අම්බලමක සිතියමක් (ලිපියේ මුලින් සඳහන්වේ)

ඡායාරූපය: 4

පේකඩ සහිත කණු දෙකක් පිට පිහිටි හංස යටලියක් මෙහි සම්පූර්ණයෙන් පෙනේ. මේ යටලියත් ඒ මත එන කුරුපාවත් යන දෙකෙහිම පිහිටන ලෙස කැටයම් කළ වෙස් මුහුණු බැඳගත් නැට්ටුවෙකුගේ රූපයකි. කැටයම කර ඇති තැන ඉඩකඩ මදි හේතුවෙන් නැට්ටුවා අඟුටුමිට්ටෙකි. කුරුපාව දෙපැත්තේ සිංහරූප යුවලකි.

ඡායාරූපය: 5

කණුවක බෙදුම්වල රූප. (1960 වර්ෂය සඳහා පුරාවිද්‍යාකොමසාරිස් තැනගේ පාලනවාර්තාවේ විසිවෙනි ඡායාරූපයේ ''ඒ'' අක්ෂරයෙන් පෙන්-වන්නේ මෙහි දකුණු කොටසේ පෙනෙන මිනිසුන් දෙදෙනෙකු යොදු කළ රටාවයි.) වම් කොටසේ නළඟනකගේ රූපයකි.

ඡායාරූපය: 6

කණුවක මල්කැටයමක්. මල්පෙති දහසයකි. එම පෙති ප්‍රමාණයෙන් හා හැඩයෙන් එකින් එකට වෙනස්ය. මෙය කෘතිම පුෂ්පයක් මිස නෛසර්-ගික මලක් නොවේ. ලිස්තරයේ බිණර මල්ය. 1960 වර්ෂය සඳහා පුරාවිද්‍යාකොමසාරිස් තැනගේ පාලන වාර්තාවේ 20 බී දරණ ඡායාරූපය හා සම කරන්න. මල් පෙති ගණන දෙකේම දහසය බැගින් වුවත් ඒවායේ හැඩ වෙනස්ය. බොරදමේ මල් ගණන එකම නොවේ. උදහරණ දෙක කණු දෙකකින්ය. කණුවේ කැටයම්ද ස්වල්ප වශයෙන් වෙනස්ය. මල්පෙති දහසයේ කැටයම කරන්නට පෙර වෘත්තය ඒ සඳහා බෙදගන්නට ඇත. මුලින් අංශක 90 ක් කෝණ සැදෙනසේ කැපුණු විෂ්කම්භයන් දෙකක් ලකුණු කරගත් සැටින්, දෙවනුව ඒ එක් එක් කෝණයක් දෙකට බෙදූ සැටින් මේ බෙදුමෙන් ලත් කෝණයන් තවත් වරක් බෙදගත් සැටින් සිතාගත හැක. මේ කෝණයන්ගේ රේඛා මල්පෙ-තිවල මැද්දට ගන්ට ඇත.

ඡායාරූපය: 7

කණුවක නෙළුම්මල් රූපයක්. මෙම මල කැපීමට ද ලියේ එක කේන්ද්‍රයක් ඇති ප්‍රමාණයෙන් එකිනෙකට වෙනස්වූ වෘත්ත කීපයක් ලකුණු කරගත් හැටින් පෙර කී න්‍යායෙන් අංශක 45ක කෝණවලට බෙදගත් සැටින් පැහැදිලිය. එහෙත් ඇතැම් තැන කැටයම් නූලෙන් පිට පැනය. මල්පෙති දූන් පිපුණා සේ ප්‍රාණවත්ව තිබේ. මල්කෙමිය පැත්තේ සිට පිටතට විහිදෙන සේ කපා ඇති ඉරිවලින් මල්පෙති පනගන්නවා ඇත.

ඡායාරූපය: 8

කණුවක මැද පරාලේ ලණුගැට කැටයමක්. මේ කැටයමද හරිහැටි බෙද ලණුවෙන් කළ ගැටයක් සේම පෙනෙන්ට නිමකර ඇත. ලිස්තරයේ බිණ-රමල් පෙන්වා තිබෙන ආකාරයයි.

ඡායාරූපය: 9

නයිදහරය. ආරුක්කු බෝක්කුවක හැඩයට කළ පනේලයක නයින් දෙදෙනෙක් එකිනෙකා ගැට ගසාගෙන ඉන්නා අන්දම මෙයින් දක්වයි. නයෙ-ක් හා හැපින්නක්ද විය හැකිය. නයින්දෙන්නාගේ පුප්පාගත් පෙණ දෙක එක්වන තැන බෝකොළ යක් වැන්නකි. මේ නයිදහරය ලණුගැටය හා සමකර බලන්න. ආරුක්කු ලිස්තරය වටේට බිණරමල් කැටයමක් හා තවත් තිත් කැටයමිය. මෙම රූපයෙන් අම්බලම කළ කාලයේ එනම් දහඅටවන සියවස පමණදී සිංහල ආරුක්කුවක හැඩද දැනගත හැකිය.

ඡායාරූපය: 10

මෙය කණුවක කොටා ඇති වෙස් බැඳි නැට්ටුවෙකුගේ රූපයකි. ඇඳුම අද උඩරට කන්කාරි නටන්-නාගේ ඇඳුමයි. අඩව්වක් අල්ලන්ට සැරසෙන අන්දමක් දක්වයි.

ඡායාරූපය: 11

කණුවක කොටා ඇති නළඟනකගේ රූපයක්. උඩුකයට හැට්ටයක් ඇති මුත් පියයුරු යුවල ප්‍රකටව පෙනෙයි. පහත කය වසා ඇති ඇඳුම නැටුමේදී වුවද සිරුර හොඳට වසා සිටින්නකි. ඇඳුමේ අමතර කෙළවරවල් දැතින් අල්ලා ගෙන නටනු පෙනේ. දහඅටවන සියවසේදී සිංහල නළඟනන් මෙසේ නැටුවා නම් ඒ නැටුම් ප්‍රභේදය සිංහල නැටුම් කලාවට කෙසේ ඇතුලුවීද යන්න විමසීමට කරුණකි.

ඡායාරූපය: 12

දෙගල්දෙරුවේ බිතුසිතුයම්වලින් අම්බලමක්. ඉහත කී පරිදි මෙයින් පෙන්වන්නේ චුල්ලසුත-සොමජාතක කථාවෙන් කොටසකි.

අශෝකස්තම්භ

ඉන්ද්‍රකීර්ති සිරිවීර

සිය රජයටත්, බුදු සමයටත් මිනිස් සංහතියටත් විශිෂ්ට සේවයක් ඉටුකළ ධර්මාශෝක, නරපතීන් අතින් භාරතීය කලාවට වූ සේවය ද සුලුපටු එකක් නොවේ. එතුමාගේ රාජ්‍ය සමයට අයත් කලාකෘතීන් ස්තූප, ලෙන් හා ස්තම්භ යනුවෙන් තුන් කොටසකට බෙදේ. එහෙත් මෙහිදී ස්තූප හා ලෙන් මඳක් අමතකකර භාරතීය කලා ක්ෂෙත්‍රයේ පතාක යෝධයින් මෙන් නැගී සිටින ස්තම්භයන් දෙසට විශෙෂ අවධානය යොමුකරමු.

කාලයේ වැලිතලාවෙන් වැසී යාමට පෙර මේ ස්තම්භයන් තිහක් පමණ වූ බවට සාධක ඇති නමුදු දැනට විද්‍යාමාන වන සංඛ්‍යාව ඉන් අඩක් පමණ වේ. දිල්ලිතෝප්රා, දිල්ලි මීරාට්, ලෞරිය අරරාජ්, ලෞරිය නන්දන්ගර්හ් රාම්පූර්ව, සාංචි, සාරනාත්, රුම්න්දෙයි, නිග්ලීව, සංකස්ස, බෂාර්-බඛිර, කොල්හුවා ආදී නම්වලින් මේ ස්තම්භ හඳුන්වනු ලැබේ. මේවායින් දහයක පමණ ශිලා ලිපි කොටවා ඇත.

අශෝකයන් සිය ස්තම්භයන් පිහිටුවීමට උපයෝගීකරගන්නා ලද්දේ බුදුන්වහන්සේ වැඩවිසීමෙන් ශුද්ධත්වයට පත්වුණු ස්ථාන හා පූජනීය ස්ථානයන් කරා යන මාර්ගයන්ය. මේ බව මැනවින් කැපී පෙනෙන ස්ථානයක් නම් පාඨලීපුත්‍ර සිට කෝසල දේශසීමානුබද්ධ ශුද්ධභූමියට වැටෙන රාජකීය මාර්ගයයි. මේ මාර්ගයේ රාම්පූර්ව, ලෞරිය අරරාජ්, ලෞරිය නන්දන්ගර්හ්, කොල්හුවා ආදි ස්ථානවල මේ ස්තම්භයන් පිහිටුවා ඇත. සාංචියේ ඇති ස්තම්භයෙන් පැහැදිලි වනුයේ සාංචියට බටහිර දෙසින් වැටී තිබුණු මාර්ගය දිගේද මෙවැනි ස්තම්භ තිබුණු බවයි. බෞද්ධ ගොඩනැගිලිවලට පෙනෙන තෙක් මානයේ පිහිටුවා ඇති මේවා ඒකස්තම්භයන් මිස ගොඩනැගිලිවල අංගයන් නොවේ.

මේ ස්තම්භ හැම එකක්ම කෙලින්ම භූමියට සවිකොට ඇත. පාමුල කිසිදු අමුතු ලක්ෂණයක් දක්නට නොලැබේ. ස්තම්භයක ප්‍රධාන අංග දෙකකි. පළමුවැන්න කඳය. දෙවැන්න ස්තම්භ ශීර්ෂයයි. වෘත්තාකාර කඳ කැටයම් මෝස්තර ආදියෙන් තොරව ඉතා චාම්ව මුල සිට අග දක්වා තල්ගසක් මෙන් සිහින්ව ගොස් ඇත. චූනාර් නම් ප්‍රදේශයේ තනි වැලිගලින් නෙලූ මෙය සීගිරි කැටපත්පවුර මෙන් මෘදුය. ඔපවත්ය. මේ ඔපය ඔපදැමීමේ කලාවේ අග්‍රම ඵලය හැටියට හැඳින්විය හැක. ග්‍රීකයන්ගේ ශෛලමය ඔපදැමීම් හෝමර් කාව්‍යවල ඉහලින් වර්ණනා කර තිබේ. එහෙත් **පර්සි බ්‍රවුන්** කියන පරිදි මෞර්ය කලාකරුවෝ ඔපදැමීම අතින් ග්‍රීකයන් පැරදූහ. පසු කාලයේ භාරතයට ආ පාහියන් හා හියුංසාං